# ජනතාවට ECTA බිල්ලා මවන විපක්ෂය



තවමත් ECTA නැතහොත් ඉන්දු-ලංකා ආර්ථික තාක්ෂණික ගිවිසුම කියා දෙයක් නොමැත. අවම වශයෙන් එකී ගිවිසුමට අදාළ මූලික කෙටුම්පතක්වත් සකස් කර නොමැත. එහෙත් උද්ඝෝෂණ සිදු වෙමින් ඇත. විරෝධතා මතු වෙමින් ඇත. එනම් නැති දෙයක් ඇති දෙයක් ලෙස සලකා ක්‍රියාමාර්ග තෝරමින් සිටින පසුබිමක් අප හමුවේ දර්ශනය වෙමින් ඇත.

විරෝධතා මතු කරන පාර්ශ්ව මූලික වශයෙන් පෙන්වා දෙන නිදර්ශන අතර දක්නට ඇත්තේ ඉන්දියාවේ බාබර්ලාගේ පටන් වෘත්තිකයන් අප රටට පැමිණ මෙරට සේවා ආර්ථිකයට අරක් ගනු ඇති බවය. ඒ අනුව කඩපිල්වල ඉන්දියානු බුලත් විට කඩයේ සිට ඩිස්පැන්සරි සහ දන්ත ශල්‍යාගාර පමණක් නොව අනෙක් සියලු වෘත්තීන්ට අදාළ කඩ ඉදිවීමට නියමිතය. ECTA

**<u>ECTA ට අදාළව රට තුළ මතුව තිබෙන විරෝධය විකාරයකි. ඒ ගිවිසුමක් තබා කෙටුම්පතක් නොමැති පසුබිමක විරෝධතා මතු කරන නිසා පමණක් නොවේය. විරෝධතාවක් වෙනුවෙන් වන සටන් පාඨවල පවා විකාරරූපී බවක් පෙනෙන්නට ඇති නිසාය.</u>**

ඒ කතා සිහිබුද්ධියෙන් අසා සිටින්නේ නැති අයකුට චෙන්නායි, කල්කටා හෝ තිරුවලර්, කාංචිපුරම් ජනාකීර්ණ වීදියක් සිහිවනු ඇත. සභාවේ සිනහා මතු විය හැකි නමුත් කියන විදිහට නම් එසේ වීම වළක්වාගත නොහැකිය.

බුදුදහමින් මිස වෙනත් කිසිදු දර්ශනයකින් පෝෂණය වීම ඓතිහාසිකව අහිමි කර ගත් අප වැනි රටක බොහෝ වෘත්තිකයන්ගේ පටන් ගමේ හරමානිස් සහ ඔහුගේ පුතාගෙත් පුතා පමණක් නොව ආගමෙන් පෙකණිය වෙන් කර ගන්නට නොහැකි වූ වාමාංශිකයාටත් මේ කතා වලංගුය. මේ පෙර දැක්ම කවදත් ඔවුන් සතුය. එයින් මිදෙන්නට ද ඔවුන් සූදානම් නැත.

කෙසේ වුවත් අපට අනුව නම් ECTA ට අදාළව රට තුළ මතුව තිබෙන විරෝධය විකාරයක්ය. ඒ ගිවිසුමක් තබා කෙටුම්පතක් නොමැති පසුබිමක විරෝධතා මතු කරන නිසා පමණක් නොවේය. විරෝධතාවක් වෙනුවෙන් වන සටන් පාඨවල පවා විකාරරූපී බවක් පෙනෙන්නට ඇති නිසාය.

ඊට එක් නිදර්ශනයක් පමණක් මෙසේ දක්වන්නට පුළුවන.

මේ විකාර විරෝධයේ මුලින්ම කියවෙන සටන් පාඨයක් වනුයේ යෝජිත ගිවිසුම හරහා මෙරට රැකියා වෙළෙඳපොළට පිවිසීමට ඉන්දියානුවන්ට ඉඩ විවර වන බව සහ ඒ තුළ අපේ තරුණ ප්‍රජාවට රැකියා අර්බුදයක් ඇති වීමේ අවදානමය. ඊටත් වඩා ඉන්දියාවේ විරැකියා වෙන් පෙළෙන්නන් මෙරට දී ලාභ මිලට ශ්‍රමය විකිණූ කල අපේ වැටුපට තට්ටු වෙයි යන්නය.

අන්න හඳ කියා පෙන්නූ විට ඇඟිල්ල දෙස බලා ආනේ හඳ උල් වෙලා කියන උදවියට මේවාට බය හිතෙන්නට පුළුවන. එහෙත් අප අවධාරණය කරනුයේ මේවාට බිය වෙන්නට තරම් දෙයක් නැති බවය. අනෙක් අතට විකාර විරෝධතා පැවැත්ම කරගත් උදවිය අවම වශයෙන් රටක වැටුප් මට්ටම් තීරණය වන ආකාරයවත් නොදැන මේ විකාර විරෝධතා සිදු කරන බවය.

අප ජීවත් වන්නේ ධනවාදී සමාජයකය. ඒ තුළ රටක වැටුප් මට්ටම ඉහළ දැමීමට ප්‍රධාන අවශ්‍යතාවක් වනුයේ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනය වැඩි වීමය. ඉන්දියාවේ වැටුප් අඩු වන්නේ එහි ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනය 1800ක් වන නිසා වන අතර ලංකාවේ එය වැඩි වන්නේ මෙරට ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනය 3800ක් වන නිසාය. ඒ අනුව තවදුරටත් මෙරට තුළ වැටුප් වැඩි කිරීමේ සිට ජීවන තත්ත්වය ඉහළ දමන්නට නම් නිෂ්පාදනය වැඩි කළ යුතුය. එනම් දළ ජාතික නිෂ්පාදනය වේගයෙන් ඉහළ යාමක් සිදු කර ගන්නට අප සමත් වනවා නම් ඒක පුද්ගල දළ ජාතික නිෂ-ʼපාදනය වැඩි වීම අනිවාර්යයක් වන අතර ඒ තුළ රැකියා අඩු වනවා නොව වැඩි වන බව අමුතුවෙන් කිවයුතු නැත. වැටුප් වැඩි වීම ද එසේමය.

වත්මන් ආණ්ඩුව බලාපොරොත්තු වන්නේ වසරකට සියයට දහය ඉක්මවන ආර්ථික වර්ධනයකි. ඒ වෙනුවෙන් තවත් සමාගම් විශාල ගණනක් මෙරටට ගෙන්වා ගැනීමට සිදු වන අතර ඉන්දියානු ලාභ ශ්‍රමයට ඉඩකඩ විවෘත කොට මෙරට ශ්‍රමයට ඉහළ වටිනාකමක් හා වැටුපක් ලබා ගන්නා ක්‍රමය උපායක් ලෙස ගෙන තිබෙන්නේ ද ඒ අනුවය. එනම් සිය ආයෝජන වෙනුවෙන් අවශ්‍ය වෘත්තිකයන් ශ්‍රී ලංකාවෙන් ලබාගත නොහැකි නම් ඉන්දියාවෙන් ලබා ගැනීමේ පහසුව ලබා දීමය. ඒ ආයෝජකයන් තුළ විශ්වාසය ඇති කිරීමේ උපායක්ය. ඒ එකී අංශයන්ට අදාළ ගිවිසුම් නොතිබුණොත් ආයෝජකයන් තුළ අවිනිශ්චිතතාව ඉහළ යන්න ඉඩ ඇති පදනමෙන්ය. අනෙක් අතට සිහි බුද්ධිය ඇති කිසිම රටක් මේ සියවසේ දී සේවා අංශය අත්හැර ගිවිසුම් ගත නොවන බව ද තේරුම් ගත යුතුය. සියල්ලටම වඩා හතර වන මාදිලියේ සේවා ගිවිසුමෙන් තබා මූලික සාකච්ඡා මේසයෙන් පවා ඉවත් කර ඇති සහ වාහන ආනයනය මෙකී ගිවිසුමේ සාකච්ඡාවෙන් ඉවත් කර තිබීම ගැනවත් මේ විකාර විරෝධතා පාර්ශ්ව තේරුම්ගත යුතුය. අවම වශයෙන් අද තවදුරටත් භාණ්ඩ වෙළෙඳාම කියා දෙයක් නැති බවත් දැන් තිබෙන්නේ භාණ්ඩ සහ සේවා වෙළෙඳාමේ සංකලනයක් බවත් තේරුම්ගත යුතුව ඇත.

ඊටත් වඩා රටක් ලෙස අද අප සිටින තැනවත් මේ විකාර විරෝධතාකරුවන් සැලකිල්ලට ගෙන නැත. අප පසුවන්නේ ජාත්‍යන්තර වෙළෙඳාම බොහෝ දුරට කඩා කප්පල් වූ පසුබිමකය. මීට දශකයකට පෙර අප දළ ජාතික නිෂ්පාදනයෙන් 35%ක් අපනයන මගින් සපුරා ගත් නමුත් අද එය 14%- 14.5 %ට වැටී ඇත. GSP තීරුබදු සහනය අහිමි කරගත් ආශ්චර්යයෙන් අපට යුරෝපයේ කෝටි 50ක ජනතාවක් සිටි වෙළෙඳපොළ ද අහිමිය. කොටින්ම අල්ලන මාළු ටිකවත් අපනයනය කරගන්නට හැකියාවක් ඇති වන ලෙස ඒ තහනම ද ඉවත් කරගන්නට තවමත් හැකිව නැත.

මේ වෙනුවෙන් මැදිහත් වීමේ දී රටවල් අතර ඇති අසමමිතිකතා සැලකිල්ලට ගන්නා අතරම ඒ තුළ අපේ ආරක්ෂාව ද තහවුරු කර ගැනීම මිස වෙළෙඳාමේ දී අපිට පමණක් වාසි ලැබෙන අමනෝඥ සිහින දැකීම ද විකාරයකට වැඩි දෙයක් නොවේය. සියල්ලටම වඩා වැදගත් වනුයේ අප මේ ජීවත් වන්නේ ධනවාදී සමාජ ක්‍රමයක බව තේරුම් ගැනීමය. ධනවාදයට ඔළුවක් මිස හදවතක් නැත.

sathhanda.lk

**FOR ALL YOUR TRANSLATIONS**
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)

( ENGLISH SINHALESE)
Documents for immigration purposes

- BIRTH , MARRIAGE, DEATH
- EDUCATIONAL/ VOCATIONAL
- LEGAL and POLICE DOCUMENTS
- NATIONAL IDENTITY CARDS

CONTACT
**DR. PREMA KUDALIGAMA**
( BA, PGDE, M.A. Ph.D (Edu.)
NAATI Level 3 (Interpreting & Translating)

Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premaku@bigpond.com

**LAND FOR SALE**
**BATTARAMULLA**
SUBUTHIPURA - ROHANA MAWATHA
**9 Perches**
Contact
**Liyanage 0468 685 464**

**කැරවෑන් කර්මාන්තයේ දක්ෂයෙක් අවශ්‍යයි.**

කැරවෑන් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාමට මනා දැනුමක් ඇති කැරවෑන් වර්ග, සැලසුම්, වැසි ඇතුළු කැරවෑන් නිපදවීමේ සියලුම දේ ගැන ඉහල පලපුරුද්දක් ඇති කෙනෙකු අවශ්‍යයි.

**කරුණාකර අමතන්න චාමර 0490104398**